# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1838/9 - 2013 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2013.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

නිවේදනය

ද්විත්ව බදුකරණයෙන් සහන සැලසීම සඳහා ද, ආදායම් මත බදු නොගෙවා පැහැර හැරීම වැළැක්වීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ලක්සම්බර්ග් මහා ආදිපාදී වසමේ ආණ්ඩුව අතර, 2013.01.31 වැනි දින එළඹි, මෙහි උපලේඛනයේ දක්වා ඇති ගිවිසුම 2013.10.23 දින සම්මත කරගන්නා ලද යෝජනාව මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති බව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ ලක්සම්බර්ග් මහා ආදිපාදී වසමේ ආණ්ඩුව අතර ආදායම් මත සහ ප්‍රාග්ධනය මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා වූ සම්මුතිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ ලක්සම්බර්ග් මහා ආදිපාදී වසමේ ආණ්ඩුව අතර, ආදායම් මත සහ ප්‍රාග්ධනය මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මගහැරීම වැළැක්වීම සඳහා සම්මුතියක් ඇතිකර ගැනීමේ අභිලාශයෙන්, මතු දැක්වෙන පරිදි එකඟ වී ඇත.

*1 වැනි වගන්තිය*

*ආවරණය වන තැනැත්තන්*

ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක හෝ දෙකෙහිම වාසිකයන් වන තැනැත්තන් කෙරෙහි මෙම ගිවිසුම අදාළ විය යුතුය.


1A - PG 1853 — 950 (2013/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*2 වැනි වගන්තිය*

*ආවරණය වන බදු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් පනවනු ලබන ආදායම් මත සහ ප්‍රාග්ධනය මත වන බදු වලට, ඒවා අය කෙරෙන ආකාරය පිළිබඳව නොසලකා මෙම සම්මුතිය අදාළ විය යුතුය.

2. චංචල හෝ නිශ්චල දේපල අන්සතු කිරීමෙන් ලබන ලාභ මත වන බදු, ව්‍යවසායන් විසින් පනවනු ලබන වේතන හෝ වැටුප් මත බදු මෙන්ම ප්‍රාග්ධන වටිනාකම් වැඩිවීම මත ගෙවනු ලබන බදු ද ඇතුළත්ව; මුළු ආදායම මත හෝ ප්‍රාග්ධනය මත හෝ ඒවායේ කොටසක් මත වන සියලුම බදු, ආදායම මත හෝ ප්‍රාග්ධනය මත වන බදු වශයෙන් සැලකිය යුතුය.

3. මෙම සම්මුතිය අදාළ වන්නා වූ දැනට පවත්නා බදු වනුයේ, විශේෂයෙන් ම,

(අ) ලක්සම්බර්ග් අධිරාජ්‍යයේ දී :

(i) පුද්ගල ආදායම් බද්ද,
(ii) සංස්ථා බද්ද,
(iii) ප්‍රාග්ධන බද්ද
(iv) ප්‍රජා වෙළඳාම් බද්ද

(මෙහි මින් මතු "ලක්සම්බර්ග් බද්ද" යනුවෙන් සඳහන් වේ.) ;

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දී :

(i) ආයෝජන මණ්ඩලය සමග එකඟතාවයකට එළඹි ව්‍යවසායන්හි පිරිවැටුම මත පදනම් වූ බද්ද ඇතුළුව, ආදායම් බද්ද ;

(මෙහි මින්මතු "ශ්‍රී ලංකා බද්ද" යනුවෙන් සඳහන් වේ) ;

4. මෙම සම්මුතිය අත්සන් කිරීමේ දිනයෙන් අනතුරුව ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් දැනට පවත්නා බදුවලට අමතරව හෝ ඒවා වෙනුවට පනවනු ලබන දැනට පවත්නා බදුවලට සමාන වූ හෝ බෙහෙවින් සමාන වූ වෙනත් යම් බදුවලට ද මෙම සම්මුතිය අදාළ විය යුතුවේ. ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරින් ඔවුන්ගේ බදුකරණ නීති පිළිබඳව කරනු ලැබ ඇති ප්‍රධාන වෙනස්කම් සම්බන්ධයෙන් එකිනෙකාට දැනුම් දිය යුතුය.

*3 වැනි වගන්තිය*

*පොදු අර්ථ නිරූපණ*

1. මෙම සම්මුතියේ කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගත යුතු වුවහොත් මිස :

(අ) "ලක්සම්බර්ග්" යන පදයෙන් ලක්සම්බර්ග් මහා ආදිපාදී වසම අදහස් වන අතර, එය භූගෝලීය අර්ථයෙන් ගත් කල ලක්සම්බර්ග් රාජ්‍යයේ දේශ සීමාව අදහස් වේ;

(ආ) "ශ්‍රී ලංකාව" යන පදයෙන් ජාත්‍යන්තර නීතියට හා ස්වකීය ජාතික ව්‍යවස්ථාවලට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් සිය ස්වෛරී අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන හෝ මින් මතුවට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි, එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ, රාජ්‍යයට අයත් මුහුදු ප්‍රදේශය හා ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශය මෙන්ම අනන්‍ය ආර්ථික කලාපය සහ මහාද්වීපික තටාකයද ඇතුළුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් දේශ සීමාව අදහස් කෙරේ ;

(ඇ) "ගිවිසුම්කාර රාජ්‍යය" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය" යන පදවලින් පද සම්බන්ධය අනුව අවශ්‍යවන පරිදි, ලක්සම්බර්ග් හෝ ශ්‍රී ලංකාව අදහස් කෙරේ;

(ඈ) "තැනැත්තා" යන පදයට යම් පුද්ගලයෙකු, සමාගමක්, සහ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

(ඉ) "සමාගම්" යන පදයෙන් සංස්ථාපිත මණ්ඩලයක් හෝ බදු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන යම් ආයතනයක්, අදහස් කෙරේ.

(ඊ) "එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක්" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක්" යන පදවලින් පිළිවෙලින් එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් අදහස් කෙරේ;

(උ) "ජාත්‍යන්තර ගමනාගමනය" යන පදයෙන්, ගිවිසුම්කාර රාජ්‍යයක ක්‍රියාකාරි කළමනාකරණ ස්ථානය පිහිටි යම් ව්‍යවසායයක් විසින් මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් මගින්, එම නැව හෝ ගුවන් යානය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථානයන් අතර පමණක්ම ක්‍රියාත්මක කරන අවස්ථාවලදී හැර, කරනු ලබන ඕනෑම ප්‍රවාහනයක් අදහස් කෙරේ;

(ඌ) "නිසි බලධාරියා" යන පදයෙන්

(i) ලක්සම්බර්ග් රාජ්‍යය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙක් ;

(ii) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඃ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු

අදහස් කෙරේ.

(එ) "රටවැසියා" යන පදයෙන් ;

(i) ගිවිසුම්කාර රාජ්‍යයක පුරවැසිභාවය හිමි යම් පුද්ගලයෙකු ;

(ii) ගිවිසුම්කාර රාජ්‍යයක බලපැවැත්වෙන නීති මගින් ස්වකීය නෛතික තත්ත්වය ලබන යම් නෛතික තැනැත්තෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක් ඃ

අදහස් කෙරේ.

(ඒ) "බද්ද" යන පදයෙන් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි ශ්‍රී ලංකා බද්ද හෝ ලක්සම්බර්ග් බද්ද අදහස් වන නමුත් මෙම ගිවිසුම අදාළ වන්නා වූ බදු සම්බන්ධයෙන් යම් පැහැර හැරීමක් හෝ අත් හැරීමක් වෙනුවෙන් ගෙවිය යුතු කිසියම් මුදලක් හෝ මෙම බදුවලට අදාළව පනවන ලද යම් දණ්ඩනයක් නියෝජනය කරන්නා වූ කිසියම් මුදලක් මෙයට ඇතුළත් නොවේ.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් යම් අවස්ථාවක දී මෙම සම්මුතිය අදාළ කර ගැනීමේ දී එහි අර්ථකථනය කොට නොමැති කිනම් හෝ පදයක්, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ නම් මිස, මෙම සම්මුතියට අදාළ වන බදු කාර්යයන් සඳහා එම රාජ්‍යයේ නීති යටතේ එම අවස්ථාවේ දරන අර්ථයම දැරිය යුතු අතර, එම පදයට එම රාජ්‍යයේ බලපවත්නා බදු නීති යටතේ දරන අර්ථය, එම රාජ්‍යයේ අනෙකුත් නීති යටතේ දරන අර්ථය ඉක්මවා අදාළ විය යුතුය.

*4 වැනි වගන්තිය*

*වාසිකයා*

1. මෙම සම්මුතියෙහි කාර්යයන් සඳහා "ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයා" යන පදයෙන් එකී රාජ්‍යයේ නීතිය යටතේ යම් තැනැත්තෙකුගේ නිත්‍ය වාසය, වාසස්ථානය, නීතිගත වූ හෝ ලියාපදිංචි වූ ස්ථානය, කළමනාකරණ ස්ථානය හෝ එවැනි සමාන ස්වභාවයක වෙනත් යම් නිර්ණායක හේතුවෙන් එම රාජ්‍යයෙහි බදු ගෙවීමට නියමිත යම් තැනැත්තෙකු අදහස් කෙරෙන අතර, එම රාජ්‍යය සහ එහි යම් දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක්ද ඊට ඇතුළත් වේ. කෙසේ වුවද, එම රාජ්‍යයේ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම හෝ එම රාජ්‍යයේ පිහිටි ප්‍රාග්ධනය සම්බන්ධයෙන් පමණක් එම රාජ්‍යය තුළ දී බද්දට යටත් වන යම් තැනැත්තෙකු මෙම පදයට ඇතුළත් නොවේ.

2. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන යම් පුද්ගලයෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකු වන කල්හී, ඔහු පිළිබඳ තත්ත්වය පහත සඳහන් පරිදි තීරණය කළ යුතුය ඃ

(අ) ඔහුට නිත්‍ය වාසස්ථානයක් තිබෙන ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුට ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම නිත්‍ය වාසස්ථානයක් තිබේ නම් ඔහු සමඟ වඩා සමීප පෞද්ගලික හා ආර්ථික සම්බන්ධතා තිබෙන (ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන) ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය.

(ආ) ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වූ ගිවිසුම්කාර රාජ්‍යය නිගමනය කළ නොහැකි නම් හෝ එක් ගිවිසුම්කාර රාජ්‍යයකවත් ඔහුට නිත්‍ය වාසස්ථානයක් නොතිබේ නම්, ඔහුට නිතර වාසය කරන වාසස්ථානයක් ඇති රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය.

(ඇ) ඔහුට ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම නිතර වාසය කරන වාසස්ථානයන් තිබේ නම් හෝ ඉන් එකකවත් එවැන්නක් නොතිබේ නම්, ඔහු තමා රටවැසියෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය.

(ඈ) ඔහු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම රටවැසියෙකු වේ නම්, හෝ ඉන් එකකවත් රටවැසියෙකු නොවේ නම්, මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟත්වයකින් යුතුව නිරාකරණය කරගනු ලැබිය යුතුය.

3. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන පුද්ගලයෙකු නොවන යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයෙකු වන කල්හී, එම තැනැත්තා එහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය. ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටි රාජ්‍යය තීරණය කළ නොහැකි අවස්ථාවන්හි දී, ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟතාවයකින් ප්‍රශ්නය නිරාකරණය කරනු ලැබිය යුතුය.

*5 වැනි වගන්තිය*

*ස්ථිර ආයතනය*

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා "ස්ථිර ආයතනය" යන පදයෙන් ව්‍යවසායෙහි ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් කරගෙන යනු ලබන ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් අදහස් කෙරේ.

2. "ස්ථිර ආයතනය" යන පදයට :

(අ) කළමනාකරණ ස්ථානයක් ;

(ආ) ශාඛාවක් ;

(ඇ) කාර්යාලයක් ;

(ඈ) කර්මාන්ත ශාලාවක් ;

(ඉ) වැඩ පොළක් ;

(ඊ) පතලක්, තෙල් හෝ ගෑස් ආකරයක්, ගල් වලක් හෝ ස්වාභාවික සම්පත් නිස්සාරණය කෙරෙන වෙනත් යම් ස්ථානයක් ;

විශේෂයෙන් ඇතුළත් වේ.

3. "ස්ථිර ආයතනය" යන පදයට මේවා ද ඇතුළත් වේ :

(අ) ගොඩනැගිලි වැඩ බිමක්, ඉදිකිරීමක්, එකලස් කිරීමේ හෝ සවි කිරීමේ ව්‍යාපෘතියක්, කැණීම් ව්‍යාපෘතියක්, ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීම සඳහා හෝ ගවේෂණය සඳහා භාවිතා කරනු ලබන විදීමේ වේදිකාවක් හෝ නැවක්, ඒ හා සම්බන්ධ අධීක්ෂණ කටයුතු ද ඇතුළුව, එහෙත් එම වැඩ බිම, ව්‍යාපෘතිය හෝ එහි කටයුතු යම් දොළොස් මසක කාලපරිච්ඡේදයක් තුළ දින 183 කට වැඩි කාලයක් පවතී නම් පමණක් ;

(ආ) ව්‍යවසායක් විසින් එකී කාර්යය සඳහා එහි සේවකයන් හෝ වෙනත් සේවක පිරිස් යොදවා උපදේශාත්මක සේවාවන් ද ඇතුළුව සේවාවන් සැපයීම, එහෙත් එබඳු ස්වභාවයේ කටයුතු රට තුළ කිසියම් දොළොස් මසක කාල පරිච්ඡේදයක් තුළ එකතුව දින 183 ක් ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් සඳහා පවතී නම් පමණක්.

4. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, "ස්ථිර ආයතනය" යන පදයට :

(අ) ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය, ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පහසුකම් පාවිච්චි කිරීම ;

(ආ) ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොග පවත්වාගෙන යාම ;

(ඇ) ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොග වෙනත් ව්‍යවසායක් විසින් සකස් කිරීමේ කාර්යය සඳහා පමණක් පවත්වාගෙන යාම ;

(ඈ) ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ හෝ තොරතුරු රැස් කිරීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඉ) ව්‍යවසාය වෙනුවෙන් හුදෙක් ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නා වෙනත් යම් කටයුත්තක් කරගෙන යනු ලැබීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඊ) එකිනෙකට සංයුක්ත කිරීමේ ප්‍රතිඵලය වශයෙන් ස්ථිර ව්‍යාපාරික ස්ථානයේ සමස්ථ ක්‍රියාකාරිත්වය ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නේ නම්, (අ) සිට (ඉ) දක්වා උප ඡේදයන්හි සඳහන් කටයුතුවල යම් සංයුතියක් මගින් පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම.

ඇතුළත් නොවන ලෙස සැලකිය යුතුය.

5. 1 සහ 2 ඡේදයන්හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, 7 වැනි ඡේදය අදාළ වන්නා වූ ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන තැනැත්තෙකු හැර යම් තැනැත්තෙකු එකී ගිවිසුම්කාර රාජ්‍යයකදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් වෙනුවෙන් ක්‍රියා කරන අවස්ථාවක දී,

(අ) එම තැනැත්තාගේ කටයුතු ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් මගින් ක්‍රියාත්මක කළේ වුවද, එය ස්ථිර ආයතනයක් බවට පත් නොකරනු ලබන 4 වැනි ඡේදයේ සඳහන් කටයුතුවලට සීමා වන්නේ නම් මිස, ව්‍යවසාය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලයක් ඇත්තා වූ ද එම ගිවිසුම්කාර රාජ්‍යයේදී එම බලය සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ ද තැනැත්තෙකු ; හෝ

(ආ) එවැනි බලයක් නොමැති වුවත්, පළමු සඳහන් රාජ්‍යයේ දී සිරිතක් වශයෙන් පවත්වාගෙන යන්නා වූ භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොගයකින් ව්‍යවසාය වෙනුවෙන් නිරතුරුව භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය නිකුත් කරන්නා වූ ද තැනැත්තෙකු ;

වන්නේ නම්, එම තැනැත්තා ව්‍යවසාය වෙනුවෙන් සිදු කරනු ලබන යම් කටයුතු සම්බන්ධයෙන් එම ව්‍යවසායට පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්ථිර ආයතනයක් ඇති ලෙස සැලකිය යුතුය.

6. ප්‍රතිරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් හැර, ගිවිසුම්කාර රාජ්‍යයක රක්ෂණ ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ වාරික එකතු කිරීම සිදු කරන්නේ නම් හෝ 7 වැනි ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන්නා වූ තැනැත්තෙකු හැර වෙනත් තැනැත්තෙකු මගින් එම භූමි ප්‍රදේශය තුළ පවතින අවදානම් රක්ෂණය කරනු ලබන්නේ නම්, මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් නොසලකා එයට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි සලකනු ලැබිය යුතුය.

7. ස්වකීය සාමාන්‍ය ක්‍රියාපරිපාටිය අනුව ක්‍රියා කරන තැරැව්කරුවකු, සාමාන්‍ය කොමිස් නියෝජිතයෙකු හෝ ස්වාධීන තත්ත්වයක් දරන වෙනත් යම් නියෝජිතයෙකු මගින් යම් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍ය තුළ ව්‍යාපාරික කටයුතු කරගෙන යන හේතුව නිසාවෙන්ම එකී ව්‍යවසායට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි නොසැලකිය යුතුය. කෙසේ වුවද, එවැනි නියෝජිතයෙකුගේ කටයුතු එම ව්‍යවසාය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් කැප කොට ඇති විටෙක සහ වාණිජ හා මුල්‍ය සබඳතාවයන්හි දි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ ආකාරයට වඩා වෙනස් ලෙස එම ව්‍යවසාය සහ නියෝජිතයා අතර කොන්දේසි ඇති කර හෝ පනවා ඇති විටෙක, මෙම ඡේදයේ අර්ථය තුළ ඔහු නිදහස් තත්ත්වයක් දරන නියෝජිතයෙකු ලෙස සලකනු නොලැබිය යුතුය.

8. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික සමාගමක්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක් පාලනය කිරීම හෝ එවැනි සමාගමක් විසින් පාලනය කරනු ලැබීම හෝ (ස්ථිර ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයකට) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යාපාරයන් කරගෙන යාම යන කරුණු හේතුවෙන්ම, එක් සමාගමක් අනෙකෙහි ස්ථිර ආයතනයක් නොවිය යුතුය.

### *6 වැනි වගන්තිය*

*නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායම*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි (කෘෂිකර්මයෙන් හෝ වන කර්මාන්තයෙන් ලබන ආදායම ද ඇතුළුව) නිශ්චල දේපළවලින් ලබන ආදායම එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. "නිශ්චල දේපළ" යන පාඨය, ප්‍රශ්නයට තුඩු දී ඇති දේපළ පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිය යටතේ එම පාඨය දරන අර්ථයම දැරිය යුතුය. කුමන අවස්ථාවක දී වුවද මෙම පාඨයට නිශ්චල දේපළවලට අනුබද්ධ වන දේපළ, පශු සම්පත් සහ කෘෂිකර්මයෙහි දී සහ වන කර්මාන්තයෙහි දී පාවිච්චි කරන උපකරණ, ඉඩකඩම් දේපළ සම්බන්ධව සාමාන්‍ය නීතියේ විධිවිධාන අදාළ වන අයිතිවාසිකම්, නිශ්චල දේපළවල භුක්තිය සහ ඛණිජ නිධි, ප්‍රභවයන් සහ වෙනත් ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම, හෝ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම් සඳහා ප්‍රතිෂ්ඨා වශයෙන් විචල්‍ය හෝ ස්ථිර ගෙවීම් ලැබීමේ අයිතිවාසිකම් ඇතුළත් විය යුතුය. නැව්, බෝට්ටු සහ ගුවන් යානා, නිශ්චල දේපළ ලෙස නොසැලකිය යුතුය.

3. නිශ්චල දේපළ කෙළින්ම ප්‍රයෝජනයට ගැනීමෙන්, කුලියට දීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමෙන් ලැබෙන ආදායමට මෙම වගන්තියේ 1 වැනි ඡේදයේ විධිවිධාන අදාළ විය යුතුය.

4. 1 වැනි සහ 3 වැනි ඡේදවල විධිවිධාන, යම් ව්‍යවසායක නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායමටද, ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කිරීම සඳහා යොදා ගන්නා නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායමට ද අදාළ විය යුතුය.

*7 වැනි වගන්තිය*

*ව්‍යාපාර ලාභ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ නම් මිස, එම ව්‍යවසායෙහි ලාභ බද්දට යටත් කළ හැකි වන්නේ එකී ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණකි. ව්‍යවසාය ඉහත කී පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යතොත් ව්‍යවසායෙහි ලාභ අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි නමුත්, එසේ බද්දට යටත් කළ හැකි වන්නේ එම ස්ථිර ආයතනයට ආරෝපණ කළ හැකි ප්‍රමාණයට පමණකි.

2. 3 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින්, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවකදී, එම ස්ථිර ආයතනය, එය ස්ථිර ආයතනයක් වන්නේ කවර ව්‍යවසායකද, එම ව්‍යවසාය සමග එම තත්ත්වයන් හෝ ඒ හා සමාන තත්ත්වයන් යටතේ, එම කටයුතු වලට හෝ ඒ හා සමාන කටයුතුවල සම්පූර්ණයෙන් ම, ස්වාධීනව නිරත වෙනස් හා අසම්බන්ධ ව්‍යවසායක් වූයේ නම් ඊට ලැබෙතැයි අපේක්ෂා කළහැකි ලාභ, එම ස්ථිර ආයතනයට ලැබුණු ලෙස එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේදී සලකනු ලැබිය යුතුය.

3. ස්ථිර ආයතනයක ලාභ තීරණය කිරීමේදී විධායක සහ පොදු පරිපාලන වියදම් ද ඇතුළුව එම ස්ථිර ආයතනයේ ව්‍යාපාරික කාර්යයන් සඳහා දරන ලද වියදම් එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයෙහි හෝ වෙනත් ස්ථානයක දී හෝ දරනු ලැබුවේ වුව ද, ඒවා අඩු කිරීම් ලෙස ඉඩදිය යුතුය. කෙසේ වුවද, (සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් හැර) පේටන්ට්, හෝ වෙනත් අයිතිවාසිකම් භාවිතා කිරීම වෙනුවෙන් රාජ්‍යභාග, ගාස්තු හෝ වෙනත් ඒ හා සමාන ගෙවීම් වශයෙන්, හෝ විශේෂිත ස්වරූපයේ සේවාවන් ඉටු කිරීම හෝ කළමනාකරණය සඳහා කොමිස් වශයෙන් හෝ, බැංකු ව්‍යවසායක් වන අවස්ථාවක දී හැර, ස්ථිර ආයතනයකට ණයට දෙන ලද මුදල් මත පොළිය වශයෙන් හෝ, ස්ථිර ආයතනය විසින් ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි වෙනත් කාර්යාලයකට ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් වෙතොත් ඒ සම්බන්ධයෙන්, එවැනි අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය. එසේම (සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් හැර) පේටන්ට් හෝ වෙනත් අයිතිවාසිකම් භාවිතා කිරීම වෙනුවෙන් රාජ්‍යභාග, ගාස්තු හෝ වෙනත් ඒ හා සමාන ගෙවීම් වශයෙන්, හෝ විශේෂිත ස්වරූපයේ සේවාවක් ඉටුකිරීම හෝ කළමනාකරණය සඳහා කොමිස් වශයෙන් හෝ, බැංකු ව්‍යවසායක් වන අවස්ථාවක දී හැර, ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි වෙනත් යම් කාර්යාලයකට ණයට දෙන ලද මුදල්වලට අදාළ පොළිය වශයෙන් හෝ ස්ථිර ආයතනය විසින් ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ එහි වෙනත් කාර්යාලයකින් අය කරන ලද මුදල් ප්‍රමාණයන්, ස්ථිර ආයතනයේ ලාභ නිර්ණය කිරීමේදී ගණන් නොගත යුතුය.

4. ව්‍යාපාරයේ මුළු ලාභය එහි විවිධ කොටස්වලට බෙදා වෙන් කිරීමේ ක්‍රමය පදනම් කොටගෙන ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභ නිර්ණය කිරීම ගිවිසුම්කාර රාජ්‍යයක සිරිතක්ව පවතිනතාක්කල් මෙම වගන්තියේ (2) ඡේදයෙහි ඇති කිසිවක් එම ගිවිසුම්කාර රාජ්‍යය එසේ සිරිත් පරිදි කළහැකි බෙදා වෙන්කිරීම මගින් බදු අයකළ හැකි ලාභ නිර්ණය කිරීමෙන් නොවැළැක්විය යුතුය. කෙසේ වුවද, අනුගමනය කරන බෙදා වෙන්කිරීමේ ක්‍රමය මෙම වගන්තියේ ඇතුළත් මූලධර්මයන්ට අනුකූල වන ප්‍රතිඵලය ඇති කරන්නක් විය යුතුය.

5. යම් ස්ථිර ආයතනයක් විසින් ව්‍යවසාය සඳහා හුදෙක් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍යවල මිලයට ගැනීම පමණක්ම හේතුවෙන් කිසිදු ලාභයක් එකී ස්ථිර ආයතනයට ආරෝපණය නොකළ යුතුය.

6. එසේ නොකිරීමට සුදුසු හා ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මිස, ඉහත කී ඡේදයන්හි කාර්යයන් සඳහා, වර්ෂයෙන් වර්ෂයට එකම ක්‍රමය මගින් ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභය තීරණය කළ යුතුය.

7. මෙම සම්මුතියෙහි වෙනත් වගන්තිවල වෙනම සඳහන් කරනු ලැබ ඇති ආදායම් වර්ග ලාභවලට ඇතුළත් වන අවස්ථාවක දී එකී වගන්තිවල විධිවිධාන සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන බල නොපෑ යුතුය.

*8 වැනි වගන්තිය*

*නාවික සහ ගුවන් ප්‍රවාහනය*

1. ජාත්‍යන්තර ගමනා ගමනයෙහි ලා ගුවන් යානා හෝ නැව් මෙහෙයුම් කිරීමෙන් උපයනු ලබන ලාභ, ව්‍යවසායෙහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතුය.

2. 1 වන ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, එක් ගිවිසුම්කාර රාජ්‍යයකින් ජාත්‍යන්තර ගමනා ගමනයෙහිලා නැව් මෙහෙයුම් කිරීමෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් විසින් උපයනු ලබන ලාභවලින් ප්‍රථමයෙන් සඳහන් කරන ලද රාජ්‍යයේ දී බදු අය කළ හැකි නමුත් එසේ අය කරනු ලබන බද්ද එම රාජ්‍යයේ අභ්‍යන්තර නීති අනුව පනවනු ලබන බද්දෙන් සියයට 50 ක් නො ඉක්මවිය යුතුය.

3. නාවික ව්‍යවසායක ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය නැවක පිහිටුවා ඇත්නම්, එම නැවේ දේශීය වරාය පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ එකී ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති බවට සැලකිය යුතු අතර, එවැනි දේශීය වරායක් නොමැති නම් එය නැවේ මෙහෙයුම්කරු වාසික වන ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටා ඇති බවට සැලකිය යුතුය.

4. කිසියම් සංචිතයකට සහභාගිවීමෙන්, බද්ධ ව්‍යාපාරයකින් හෝ ජාත්‍යන්තර මෙහෙයුම් නියෝජිතායතනයකින් ලැබෙන ලාභවලටද, 1 වන හා 2 වන ඡේදවල විධිවිධාන අදාළ වියයුතු ය.

*9 වැනි වගන්තිය*

*සම්බන්ධිත ව්‍යවසායන්*

1. (අ) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණය, පාලනය හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන ; හෝ

(ආ) එකම තැනැත්තන් එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන අවස්ථාවක,

සහ ඒ අවස්ථා දෙකින් කවර අවස්ථාවකදී වුවද, ස්වාධීන ව්‍යවසායන් අතර පවත්නා වාණිජ්‍ය හා මූල්‍ය සම්බන්ධතා පිළිබඳ කොන්දේසිවලට වෙනස් කොන්දේසි ඒ ව්‍යවසායන් දෙක අතර පිළියෙල කර හෝ පනවා ඇති කල්හි ද, ඒ කොන්දේසි නොතිබුණි නම් ඒ ව්‍යවසායන්ගෙන් එකකට උපචිත විය හැකි වූ නමුත්, ඒ කොන්දේසි නිසා එසේ උපචිත නොවූ කවර ලාභ වුවද, ඒ ව්‍යවසායේ ලාභ වලට ඇතුළත් කර, ඒ අනුව ලාභ මත බදු අය කළ හැකිය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් එම රාජ්‍යයේ ව්‍යවසායක ලාභයට ඇතුළත් කරනු ලබන සහ බද්දට යටත් කරනු ලබන ලාභ, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලැබ එහි බද්දට යටත් කරනු ලැබ ඇති අවස්ථාවකදී, සහ එසේ ඇතුළත් කර ඇති ලාභ, ව්‍යවසායන් දෙක අතර ඇති කරගත් කොන්දේසි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ කොන්දේසිම වන විටෙක, පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේ ව්‍යවසායකට උපචිත විය හැකිව තිබූ ලාභ වන්නේ නම් එවිට එම ලාභ මත අය කරනු ලබන බදු ප්‍රමාණයට යෝග්‍ය ගැලපුමක්, එම අනෙක් රාජ්‍යය විසින් කළ යුතුය. එවැනි ගැලපුමක් තීරණය කිරීමේදී මෙම සම්මුතියේ අනෙකුත් විධිවිධාන කෙරෙහි ද නිසි අවධානය යොමු කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරයන් එකිනෙකා විමසිය යුතු වන්නේය.

*10 වැනි වගන්තිය*

*ලාභාංශ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන ලාභාංශ එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුවද, ලාභාංශ ගෙවන සමාගම වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිවලට අනුකූලවද එවැනි ලාභාංශ වලින් බදු අය කළ හැකි නමුත්, ලාභාංශවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කරන බද්ද ;

(අ) අර්ථලාභී හිමිකරු ලාභාංශ ගෙවනු ලබන සමාගමෙහි ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් 25 % ක් සඳහා සෘජු හිමිකම් සහිත (හවුල් ව්‍යාපාරයක් නොවන) සමාගමක් නම්, දළ ලාභාංශ ප්‍රමාණයෙන් 7.5 % කට ද ,

(ආ) අන් සියලුම අවස්ථාවල දී දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 10 කට ද,

වැඩි නොවිය යුතු ය.

ලාභාංශ ගෙවනු ලබන සමාගමේ ලාභ සම්බන්ධයෙන්, සමාගමෙන් බදු අය කිරීමේදී මෙම ඡේදය බල නොපෑ යුතු ය.

3. මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි "ලාභාංශ" යන පදයෙන් කොටස් වලින් ලබන ආදායමක් හෝ ණය මුදල් වෙනුවෙන් වන හිමිකම්පෑමක් නොවන්නා වූ වෙනත් අයිතිවාසිකමක් මත ලබන ආදායමක් වන්නා වූ ද, ලාභයට සහභාගි වන්නා වූ ද, රාජ්‍යයේ බලපවත්නා නීතියට අනුව යම් වාසික සමාගමක් කොටස් බෙදාහරිනු ලබන විටකදී අදාළ සමාන බදුකරණ රීතීන්ට යටත් වන්නා වූ සංස්ථාපිත අයිතිවාසිකම්වලින් ලැබෙන ආදායම් ද අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ, ලාභාංශවල අර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවන සමාගම වාසික වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් හෝ එහි පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පුද්ගලික සේවාවන් එම අනෙක් රාජ්‍යය තුළ ඉටු කරන්නේ නම් සහ ලාභාංශ ගෙවනු ලබන කොටස් දැරීම එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ ඵලදායී ලෙස සම්බන්ධව පවතී නම්, මෙම වගන්තියේ 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවලදී 7 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ලාභ හෝ ආදායම් උපයන අවස්ථාවකදී, එම සමාගම එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකුට ලාභාංශ ගෙවනු ලබන විටෙක හෝ එම අනෙක් රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයකට හෝ ස්ථාවර පදනමකට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති කොටස් දැරීමක් සම්බන්ධයෙන් වන විටෙක හැර, සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් බදු කිසිවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් නොපනවා සිටිය හැකිවාක් මෙන්ම, සමාගමේ ගෙවන ලද ලාභාංශ හෝ නොබෙදූ ලාභ එම අනෙක් රාජ්‍යයෙහි පැන නගින ලාභ හෝ ආදායම්වලින් මුළුමනින්ම හෝ අඩ වශයෙන් සමන්විත වන්නේ වුවද සමාගමේ නොබෙදූ ලාභ, සමාගමේ නොබෙදූ ලාභ මත වන බද්දකට භාජනය නොකරද සිටිය හැකි ය.

## *11 වැනි වගන්තිය*

### *පොළී ආදායම*

1. ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගත වන පොළිය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටකදී, එම පොළිය එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේ වුවද, එම පොළියෙන් එය උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී ද, එම රාජ්‍යයේ නීතිය අනුව බදු අය කළ හැකි නමුත්, පොළියේ අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වේ නම්, එසේ අයකරනු ලබන බද්ද දළ පොළී ප්‍රමාණයෙන් සියයට 10ක් නොඉක්ම විය යුතු ය.

3. මෙම වගන්තියේ 2 වන ඡේදයේ විධිවිධාන නොසලකා, 1 වන ඡේදයේ සඳහන් පොළියේ අර්ථලාභී හිමිකරු එම පොළිය උද්ගත වන රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, සහ

(අ) එම ගිවිසුම්කාර රාජ්‍යය හෝ මහ බැංකුව, එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් වන්නේ නම් ;

(ආ) එකී රාජ්‍යය වන්නේ නම් හෝ එහි පිහිටි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් හෝ අපනයන මූල්‍ය නියෝජිතායතනයක් වෙත ගෙවීමට බැඳී සිටින ඒ මගින් සපයනු ලබන, ඇප වෙන හෝ රක්ෂණය කරනු ලබන ණය මුදලක්, ණය හිමිකමක් හෝ ණයවරයක් සම්බන්ධයෙන් ඊට පොළිය ගෙවනු ලබන්නේ නම් ;

පොළී ලබන්නා වාසිකයෙකු වන රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු වේ.

4. මෙම වගන්තියේ යෙදී තිබෙන "පොළිය" යන පදයෙන් උකසක් මගින් ඇප තබා ඇති හෝ නැති, ණයගැතියාගේ ලාභවලට සහභාගීවීමේ අයිතිවාසිකම් සහිත හෝ රහිත, සියලු වර්ගයන්හි ණය හිමිකම්වලින් ලැබෙන ආදායම සහ විශේෂයෙන් රජයේ ඇපකරවලින් සහ බැඳුම්කර හෝ ඍණ පත්‍රවලින් ලැබෙන අධි මිල සහ ත්‍යාග ඇතුළත් ආදායම අදහස් වේ. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාද ගෙවීම් වෙනුවෙන් අය කරන දඬ මුදල පොළිය ලෙස සලකනු නොලැබිය යුතුය.

5. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන පොළී ආදායමෙහි අර්ථලාභී හිමිකරු, පොළිය උද්ගතවන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම් හෝ එහි පිහිටා ඇති ස්ථාවර පදනමක් මගින් එකී අනෙක් රාජ්‍යයෙහි ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කරනු ලබන්නේ නම් සහ පොළිය ගෙවනු ලබන ණය හිමිකම, එම ස්ථිර ආයතනය සමඟ හෝ ස්ථාවර පදනම සමඟ හෝ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම් 1 වන, 2 වන සහ 3 වන ඡේදයන්හි විධිවිධාන අදාළ නොවේ. එවැනි අවස්ථාවලදී මෙම සම්මුතියේ 7 වන වගන්තියේ සහ 14 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

6. පොළිය ගෙවන්නා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන කල්හි, එකී පොළිය එම ගිවිසුම්කාර රාජ්‍යයේදී උද්ගත වන ලෙස සැළකිය යුතු ය. කෙසේ වෙතත්, එම පොළිය ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වූවද, නොවූ ව ද, ඔහුට පොළිය ගෙවීමට හේතු වූ ණයගැති භාවය හා සම්බන්ධ වූ ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක තිබෙන අවස්ථාවකදී සහ එම ආදායම දරනු ලබන්නේ එම ස්ථිර ආයතනය විසින් නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම තිබෙන රාජ්‍යයේ දී එම ආදායම උද්ගත වන ලෙස සැලකිය යුතුය.

7. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනා සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධයක් හේතුවෙන් ණය හිමිකම් සැලකිල්ලට ගනිමින්, ගෙවනු ලබන පොළී ප්‍රමාණය, එවැනි සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී ගෙවන්නා සහ අර්ථලාභී හිමිකම් ඇති තැනැත්තා විසින් එකඟ විය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන්නේ නම්, මෙම වගන්තියේ විධිවිධාන බල පැවැත්විය යුත්තේ අවසානයේ සඳහන් කළ ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක ගෙවීම්වල අතිරික්ත කොටස, මෙම සම්මුතියෙහි අනෙක් විධිවිධාන සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින්, ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව තවදුරටත් බදුවලට යටත් කළ යුතුය.

### *12 වැනි වගන්තිය*

### *රාජ්‍යභාග*

1. ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වෙත ගෙවන රාජ්‍යභාග ඒ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේ වුවද, එම රාජ්‍යභාග, ඒවා උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව බද්දට යටත් කළ හැකි වේ. එහෙත් රාජ්‍යභාගවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකු වන්නේ නම්, එසේ අය කෙරෙන බද්ද එම රාජ්‍යභාගවල දළ ප්‍රමාණයෙන් 10 % නොඉක්මවිය යුතුය.

3. මෙම වගන්තියේ යොදා ඇති පරිදි "රාජ්‍යභාග" යන පදයෙන් සිනමා රූපක චිත්‍රපට සහ චිත්‍රපට හෝ ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශනය සඳහා යොදා ගන්නා පටල, හඬපටි ඇතුළු කිසියම් සාහිත්‍යමය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක ප්‍රකාශන අයිතියක්, කිසියම් පේටන්ට් බලපත්‍රයක්, වෙළෙඳ ලකුණක්, මෝස්තරයක් හෝ ආදර්ශකයක්, පරිගණක මෘදුකාංග වැඩ සටහනක්, පිඹුරක්, රහස්‍ය වට්ටෝරුවක් හෝ ක්‍රියාවලියක් කාර්මික, වාණිජමය හෝ විද්‍යාත්මක උපකරණ හෝ විද්‍යාත්මක, වාණිජ්‍යමය හෝ කාර්මික අත්දැකීමක් සම්බන්ධ තොරතුරු පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීමේ අයිතිය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලැබුණු ඕනෑම වර්ගයක ගෙවීම් අදහස් කෙරෙයි.

4. රාජ්‍යභාගවල අර්ථලාභී හිමිකරු ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුව, රාජ්‍යභාග උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරයක් කරගෙන යන අවස්ථාවක හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය තුළ පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන සේවා පවත්වාගෙන යන අවස්ථාවක සහ රාජ්‍යභාග ගෙවනු ලබන්නේ කවර අයිතිවාසිකමක් හෝ දේපළක් සම්බන්ධයෙන්ද, එම අයිතිවාසිකම හෝ දේපළ, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, මෙම වගන්තියේ 1 වන සහ 2 වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

5. රාජ්‍යභාග ගෙවන්නා එම රාජ්‍යයේම වාසිකයෙකු වන කල්හි, රාජ්‍යභාග එම ගිවිසුම්කාර රාජ්‍යයේ උද්ගත වන ලෙස සැළකිය යුතුය. කෙසේ වෙතත් රාජ්‍යභාග ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුව ද, නොවූ ව ද, රාජ්‍යභාග ගෙවීමේ වගකීම හා බැඳුනු ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක ඔහු සතුව තිබේ නම් සහ එම රාජ්‍යභාග එම ස්ථිර ආයතනය හෝ ස්ථිර පදනම විසින් දරනු ලබන්නේ නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථිර පදනම පිහිටි රාජ්‍යයේ දී එම රාජ්‍යභාග උද්ගත වන ලෙස සැලකිය යුතුය.

6. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනාම සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධතාවයක් නිසා, පාවිච්චිය, අයිතිවාසිකම හෝ තොරතුරු සැලකිල්ලට ගනිමින්, ගෙවනු ලබන රාජ්‍යභාග එවැනි සම්බන්ධතාවයක් නොමැති විට ගෙවන්නා සහ ලබන්නා විසින් එකඟවිය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන විට, මෙම වගන්තියේ විධිවිධාන අදාළ විය යුත්තේ අවසානයට සඳහන් ප්‍රමාණයට පමණි. මෙම සම්මුතියෙහි අනෙක් විධිවිධානයන් කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, එම අවස්ථාවේදී ගෙවීම්වල අතිරික්තය එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුකූලව තවදුරටත් බද්දට යටත් වියයුතුය.

*13 වැනි වගන්තිය*

*ප්‍රාග්ධන ලාභ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, මෙම සම්මුතියෙහි 6 වැනි වගන්තියෙහි සඳහන් කරන්නා වූ ද, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටියා වූ ද, නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් උපයා ගන්නා ලද ලාභ, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළහැකි ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළ වලින් කොටසක් වන චංචල දේපළ අන්සතු කිරීමෙන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථාවර පදනමකට අදාළව ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා පවතින චංචල දේපළ අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම ස්ථිර ආයතනය (එය පමණක් හෝ සම්පූර්ණ ව්‍යවසාය සමඟ) හෝ එකී ස්ථාවර පදනම අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ ද ඇතුළුව, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

3. වටිනාකමින් 50% ට වඩා වැඩි ප්‍රමාණයක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටා ඇති නිශ්චල දේපළවලින් ඍජුවම හෝ වක්‍රව ලබෙන්නා වූ, කොටස් හෝ සමාගමක ලාභයට දායක වන අනෙකුත් සංස්ථා අයිතීන් අන්සතු කිරීමෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් ලබා ගන්නා ලාභ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකිය.

කෙසේ වෙතත්,

(අ) ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක පිළිගත් ව්‍යාපාර වස්තු වෙළෙඳපොළක මිල ගණන් ඉදිරිපත් කර ඇති හෝ ;

(ආ) සමාගමක්, වෙළෙඳ ආයතන දෙකක ඒකාබද්ධයක්, හෝ බෙදීමක් හෝ ඒ හා සමාන ක්‍රියාවලියක් ප්‍රතිසංවිධානය කිරීමේ මූලික ව්‍යූහයක් අන්සතු කළ හෝ හුවමාරු කළ හෝ ;

(ඇ) සමාගම එහි කාර්යයන් සිදු කරනු ලබන නිශ්චල දේපළ මගින් උත්පාදනය වන වටිනාකමින් 75% ක් හෝ ඊට වැඩි ප්‍රමාණය හෝ ;

(ඈ) අන්සතු කරනු ලබන කොටස් සහිත සමාගමේ ප්‍රාග්ධනයෙන් 75% ට වඩා අඩු ප්‍රමාණයකට ඍජු ලෙසම හිමිකම් කියන පුද්ගලයෙකුට අයත්.

කොටස් අන්සතු කිරීමෙන් ලැබෙන ආදායමට මෙම ඡේදය අදාළ නොවේ.

4. අන්තර්ජාතික ගමනාගමනයෙහි යොදවන ලද නැව් හෝ ගුවන් යානා හෝ එවැනි නැව් හෝ ගුවන් යානා මෙහෙයවීමට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ, එකී ව්‍යවසායෙහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති ගිවිසුම්කාර රාජ්‍යයන්හි දී පමණක් බද්දට යටත් කළ යුතුය.

5. මෙම වගන්තියේ 1, 2, 3 සහ 4 ඡේදවල සඳහන් දේපළ හැර ඕනෑම දේපළක් අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම දේපළ අන්සතු කරන්නා වාසිකයෙකුව සිටින ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

*14 වැනි වගන්තිය*

*ස්වාධීන පෞද්ගලික සේවා*

1. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ද බද්දට යටත් කළ හැකි පහත සඳහන් අවස්ථාවල දී හැර, වෘත්තීය සේවා හෝ සමාන ස්වභාවයේ වෙනත් ස්වාධීන ක්‍රියාකාරකම් වෙනුවෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විසින් ලබන ආදායම, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(අ) තම කටයුතු ඉටුකර ගැනීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථාවර පදනමක් නිරන්තරව ඔහුට ඇති කල්හි, එම ස්ථාවර පදනම සඳහා ආරෝපණය කළහැකි ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

(ආ) මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළ දී එකතුව දින 183 ක් හෝ ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් තුල අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ගත කරන විට එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සිය කටයුතුවලින් ලබන ආදායම පමණක් එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළහැකි ය.

2. "වෘත්තීය සේවා" යන පදයට ස්වාධීන, විද්‍යාත්මක, සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මෙන්ම වෛද්‍යවරුන්ගේ, නීතිඥයින්ගේ, ඉංජිනේරුවරුන්ගේ, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ සහ ගණකාධිකාරීවරුන්ගේ ස්වාධීන ක්‍රියාකාරකම් ද විශේෂයෙන් ඇතුළත් වේ.

*15 වැනි වගන්තිය*

*පරායත්ත පෞද්ගලික සේවා*

1. මෙම සම්මුතියෙහි 16, 18 හා 19 වන වගන්තිවල විධිවිධානයන්ට යටත්ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සේවා නියුක්තියක් වෙනුවෙන් උපයන වැටුප්, වේතන සහ එවැනි වෙනත් පාරිශ්‍රමිකයන්, එකී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි නොවන්නේ නම්, එම රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් විය යුතුය. එසේ සේවා නියුක්තියෙහි යෙදෙන්නේ නම්, එම සේවා නියුක්තියෙන් උපයන ලද පාරිශ්‍රමික එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. 1 වැනි ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි යෙදෙන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් උපයනු ලබන පාරිශ්‍රමිකය :

(අ) එම පාරිශ්‍රමිකය ලබන්නා අදාළ මූල්‍ය වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් දොළොස් මාසයක කාලපරිච්ඡේදයක් තුළ එකතුව දින 183 කට නොවැඩි කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින්නේ නම් ; සහ

(ආ) එම පාරිශ්‍රමිකය, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු නොවන සේවා යෝජකයෙකු විසින් හෝ වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම් ; සහ

(ඇ) එම පාරිශ්‍රමිකය, සේවා යෝජකයාට එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයකින් හෝ ස්ථාවර පදනමකින් දරනු නොලබන්නේ නම්,

එකී පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතුය.

3. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා මෙහෙයවනු ලබන නැවක හෝ ගුවන් යානයක් තුළ කරනු ලබන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් උපයනු ලබන පාරිශ්‍රමිකය, ව්‍යවසායෙහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටි රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළයුතු ය.

*16 වැනි වගන්තිය*

*අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් හෝ වෙනත් ඒ හා සමාන තත්ත්වයක් දැරීමෙන් උපයන අධ්‍යක්ෂ ගාස්තු හා ඊට සමාන ගෙවීම්, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

*17 වැනි වගන්තිය*

*කලා ශිල්පීන් සහ ක්‍රීඩකයන්*

1. මෙම සම්මුතියෙහි 14 සහ 15 වැනි වගන්තියෙහි විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු නාට්‍ය, චලන චිත්‍රපට, ගුවන් විදුලි හෝ රූපවාහිනී ශිල්පියකු වැනි කලා ශිල්පියෙකු හෝ සංගීතඥයකු හෝ ක්‍රීඩකයකු වශයෙන් ස්වකීය පුද්ගලික ක්‍රියාකාරකම්වල අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී නිරත වීමෙන් උපයනු ලබන ආදායම, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කලා ශිල්පියෙකු හෝ ක්‍රීඩකයෙකු විසින් එබඳු ස්වකීය පුද්ගලික කටයුතු වල නිරතවීම සම්බන්ධයෙන් වන ආදායම, එම කලා ශිල්පියාටම හෝ ක්‍රීඩකයාටම නොව, වෙනත් තැනැත්තෙකුට උපචිත වන අවස්ථාවකදී, එම ආදායම, 7 වැනි 14 වැනි සහ 15 වැනි වගන්තිවල කුමක් සඳහන් වුවද, කලා ශිල්පියාගේ හෝ ක්‍රීඩකයාගේ කටයුතු ක්‍රියාත්මක වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

3. 1 වන සහ 2 වන ඡේදයන්හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, 1 වන ඡේදයෙහි සඳහන් ක්‍රියාකාරකම් වලින් උද්ගත වන ආදායම ගිවිසුම්කාර රාජ්‍යයන් අතර පවතින සංස්කෘතික ගිවිසුමක් හෝ වැඩ පිළිවෙලක් යටතේ සිදුවූවක් වන විට සහ එම සංචාරය සඳහා ආධාර, පූර්ණ හෝ ප්‍රමාණවත් වශයෙන් ගිවිසුම්කාර රාජ්‍යයන් අතුරින් එකක හෝ එහි පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය ආයතනයක් හෝ ලබා දී ඇති විට, එම ක්‍රියාකාරකම් සිදුවන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් කළ යුතු ය.

*18 වැනි වගන්තිය*

*විශ්‍රාම වැටුප්*

1. 19 වන වගන්තියේ 2 වන ඡේදයේ විධිවිධානයන්ට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අතීත සේවා සැලකිල්ලට ගෙන ගෙවනු ලබන විශ්‍රාම වැටුප් හෝ ඊට සමාන පාරිශ්‍රමික එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතුය.

2. මෙම වගන්තියෙහි 1 ඡේදයෙහි විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක සමාජ ආරක්ෂණ පද්ධතියක් යටතේ ගෙවන ලද විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ගෙවීම් එම ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතුය.

3. එක් ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන වාර්ෂික, පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකිය.

4. "වාර්ෂික" යන පදයෙන් මුදලින් හෝ මුදලේ වටිනාකමේ ප්‍රමාණවත් හා සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් වෙනුවෙන් ගෙවීම් කිරීමේ බැඳියාවක් යටතේ, ආයු කාලය තුළ දී හෝ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නිශ්චය කළහැකි කාල පරිච්ඡේදයක් තුළ දී කාලීනව ගෙවිය යුතු වන ප්‍රකාශිත මුදලක් අදහස් වේ.

5. 1 වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකුට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් හෝ ඊට සමාන පාරිශ්‍රමික (එකවර ගෙවීම් ද ඇතුළුව) පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු වේ. කෙසේ වුවද, එවැනි ගෙවීම් එම විශ්‍රාම වැටුප් හෝ පාරිශ්‍රමිකලාභියා විසින්ම හෝ ඔහු වෙනුවෙන් ගෙවන ලද, දායක මුදලින් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් යටතේ ඔහු වෙනුවෙන් සපයන ලද ප්‍රතිපාදන මගින් සිදු කරනු ලබන්නේ නම් සහ මෙම දායක මුදල්, ප්‍රතිපාදන හෝ විශ්‍රාම වැටුප හෝ ඊට සමාන පාරිශ්‍රමික පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේ සාමාන්‍ය බදු නීති යටතේ බද්දට යටත් වී තිබිය හැකිය.

*19 වැනි වගන්තිය*

*ආණ්ඩුවේ සේවය*

1. (අ) ගිවිසුම්කාර රාජ්‍යයක්, දේශපාලන උප කොට්ඨාශයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් එම රාජ්‍යය වෙත, දේශපාලන උප කොට්ඨාශය වෙත හෝ පළාත් පාලන ආයතනය වෙත කරන ලද සේවාවන් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන වැටුප්, වේතන සහ වෙනත් සමාන පාරිශ්‍රමික එම රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළයුතු ය.

(ආ) කෙසේ වුවද, එම සේවාවන් ඉටු කරන ලද්දේ අනෙක් රාජ්‍යයෙහි දී නම් සහ එකී පුද්ගලයා එම රාජ්‍යයෙහි වාසිකයෙකු වන්නේ නම්, ඔහු :

(i) එම අනෙක් රාජ්‍යයේ ජාතිකයෙකු වේ නම් ; සහ

(ii) හුදෙක් එම සේවාවන් ඉටු කිරීමේ කාර්යය සඳහාම පමණක් එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු බවට පත් නොවූයේ නම් ;

එවැනි වැටුප්, වේතන හා වෙනත් සමාන පාරිශ්‍රමිකයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

2. (අ) 1 වන ඡේදයේ කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ පළාත් පාලන අධිකාරියක් විසින් හෝ එයින් ඇති කරන ලද අරමුදල් වලින් එම ගිවිසුම්කාර රාජ්‍යය වෙත හෝ දේශපාලන උප කොට්ඨාශය හෝ අධිකාරිය වෙත ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපක් හෝ අනෙකුත් ඊට සමාන පාරිශ්‍රමික එම රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(ආ) කෙසේ වුවද, එම පුද්ගලයා එකී අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු සහ ජාතිකයෙකු වන්නේ නම් එවැනි විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ඊට සමාන පාරිශ්‍රමික අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතුය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාසයක් හෝ පළාත් පාලන අධිකාරියක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඉටු කරන ලද සේවාවන්ට අදාළ වන වැටුප්, වේතන, විශ්‍රාම වැටුප් සහ වෙනත් සමාන පාරිශ්‍රමිකයන්ට 15, 16, 17 සහ 18 යන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතුය.

*20 වැනි වගන්තිය*

*ශිෂ්‍යයන් සහ අභ්‍යාසලාභීන්*

1. ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකකට පැමිණීමට පූර්වාසන්නයෙහි, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වූ හෝ එම රාජ්‍යයේ වාසිකයෙකු වන, ස්වකීය අධ්‍යාපනය හෝ පුහුණුව සඳහා පමණක් පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින ශිෂ්‍යයෙකු, ආධුනිකයෙකු හෝ ව්‍යාපාර අභ්‍යාසලාභියෙකු ස්වකීය නඩත්තුව, අධ්‍යාපනය හෝ පුහුණුව සම්බන්ධ කාර්යයන් සඳහා ලැබූ ගෙවීම්, එම පළමු සඳහන් රාජ්‍යයෙන් පරිබාහිරව ඇති ප්‍රභවයන්ගෙන් සිදු කරන්නේ නම්, එම පළමු සඳහන් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

*21 වැනි වගන්තිය*

*වෙනත් ආදායම්*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට මෙම සම්මුතියෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන ආදායම් විෂය අයිතමයන් උද්ගතවීම කොතැනක සිදුවුවත්, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වෙමින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී රාජ්‍යයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් රාජ්‍යයේ ස්වාධීන පුද්ගලික සේවාවක් ඉටු කරයි නම් සහ ආදායම ගෙවනු ලබන අයිතිවාසිකම හෝ දේපළ ඉහත සඳහන් ස්ථිර ආයතනයට හෝ ස්ථාවර පදනමට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති නම්, 6 වන වගන්තියේ 2 ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චල දේපළවලින් ලැබෙන ආදායම, නොවන ආදායමට මෙම වගන්තියෙහි 1 ඡේදයේ විධිවිධාන අදාළ නොවේ. එබඳු අවස්ථාවන්හී දී 7 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුත්තේය.

*22 වැනි වගන්තිය*

*ප්‍රාග්ධනය*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි 6 වන වගන්තියෙහි දක්වා ඇති නිශ්චල දේපළ මගින් නියෝජනය වන ප්‍රාග්ධනය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකිය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළවලින් කොටසක් වන චංචල දේපළ මගින් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්ථාවර පදනමකට අදාළව ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා පවතින චංචල දේපළ මගින් හෝ නියෝජනය කරනු ලබන ප්‍රාග්ධනය එහි අනෙක් රාජ්‍යයේදී බද්දට යටත් කළ හැක.

3. අන්තර් ජාතික ගමනාගමනයෙහිලා යොදවන ලද නැව් හෝ ගුවන්යානා මගින් සහ එවැනි නැව් හෝ ගුවන්යානා මෙහෙයවීමට අදාල චංචල දේපළ මගින් නියෝජනය වන ප්‍රාග්ධනය ව්‍යවසායෙහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතුය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකුගේ අදාළ අනෙකුත් සියලුම ප්‍රාග්ධන මූලයන් එකී රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතුය.

*23 වැනි වගන්තිය*

*ද්විත්ව බදුකරණය ඉවත් කිරීම*

1. ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සම්බන්ධයෙන් ලක්සම්බර්ග් රාජ්‍යයෙහි පවත්නා විධිවිධානවලට යටත්ව හා එහි පොදු ප්‍රතිපත්තීන්ට බලපෑම් ඇති නොකරමින්, ද්විත්ව බදුකරණය ඉවත් කිරීම පහත පරිදි සිදු කළ යුතු වේ.

(අ) ලක්සම්බර්ග්හි වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම හෝ ඔහුට අයත් ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවේදී මෙම සම්මුතියෙහි විධිවිධානවලට අනුකූලව බද්දට යටත් විය හැකි නම්, (ආ), (ඇ) සහ (ඈ) උප ඡේදයන්හි සඳහන් විධිවිධානවලට යටත්ව ලක්සම්බර්ග් රාජ්‍යය විසින් එවැනි ආදායම් හෝ ප්‍රාග්ධනය බද්දෙන් නිදහස් කළ යුතු නමුත් වාසිකයාගේ ඉතිරි ආදායම හෝ ප්‍රාග්ධනය මත බදු ප්‍රමාණය ගණනය කිරීම පිණිස ආදායම හෝ ප්‍රාග්ධනය නිදහස් නොකර ඇති සේ සලකා බදු අනුපාතිකයන් අදාළ කර ගත යුතු වේ.

(ආ) මෙම සම්මුතියෙහි 8, 10, 11, 12 සහ 17 යන වගන්තිවල විධිවිධානයන්ට අනුකූලව ලක්සම්බර්ග් රාජ්‍යයේ වාසිකයෙකු විසින් උපයන ආදායම ශ්‍රී ලංකාවේදී බද්දට යටත් විය හැකි නම් පුද්ගලයින් මත වන ආදායම් බද්දෙන් හෝ එකී වාසිකයාගේ සංස්ථාපිත බද්දෙන් ඔහු විසින් ශ්‍රී ලංකාවේදී ගෙවන ලද බද්දට සමාන ප්‍රමාණයකට ලක්සම්බර්ග් රාජ්‍යය විසින් බද්දෙන් අඩු කිරීමක් ලෙස ඉඩ ලබා දිය යුතුය. කෙසේ වුවද, එම අඩු කිරීම කුමනාකාරයක හෝ එවැනි බදු බැරක් අඩු කිරීම ලබාදීමට පෙර ගණනය කරන ලද ශ්‍රී ලංකාවේදී පැන නගින එකී ආදායම් අයිතමයට ආරෝපණය කළ හැකි බද්දේ කොටස නොඉක්මවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ ප්‍රභවයන්ගෙන් ලාභාංශ ලබා ගන්නා ලක්සම්බර්ග් රාජ්‍යයේ වාසික වන සමාගමක් සඳහා එම වාසික සමාගමට, ලාභාංශ ගෙවනු ලබන සමාගමෙහි ප්‍රාග්ධනයෙන් ගිණුම් වර්ෂය ආරම්භයේ සිටම අවම වශයෙන් 10% ක ප්‍රමාණයකට සෘජුවම හිමිකම් තිබේ නම් සහ මෙම සමාගම ශ්‍රී ලංකාවේදී ආදායම් බද්දට යටත් වන්නේ නම්, ලක්සම්බර්ග් රාජ්‍යයේදී එහි ජාතික බදු නීතිවලට අනුව එවැනි ලාභාංශ බද්දෙන් නිදහස් කළ යුතුය. ශ්‍රී ලංකාවේ සමාගමක් සතු ඉහත සඳහන් කළ කොටස් එම කොන්දේසි යටතේම ලක්සම්බර්ග් ප්‍රාග්ධන බද්දෙන් නිදහස් වේ. බදු දිරි ගැන්වීමක් වශයෙන් ශ්‍රී ලංකාවේ පවතින නෛතික විධිවිධාන යටතේ ශ්‍රී ලංකා සමාගම ආදායම් බද්දෙන් නිදහස් වීම හෝ අඩු කළ අනුප්‍රමාණයකින් බදු අය කිරීම හෝ නොතකා මෙම නිදහස් කිරීම අදාළ වේ.

(ඈ) ශ්‍රී ලංකාව විසින්, ලක්සම්බර්ග් රාජ්‍යයේ වාසිකයෙකුට උද්ගත වන ආදායම හෝ ඔහුට අයත් ප්‍රාග්ධනය බද්දෙන් නිදහස් කිරීම සඳහා මෙම සම්මුතියේ විධිවිධාන යොදා ගන්නා විට හෝ එවැනි ආදායමක් සම්බන්ධයෙන් 10 වන, 11 වන හෝ 12 වන වගන්තියෙහි 2 වන ඡේදයේ විධිවිධාන යොදා ගන්නා විට එවැනි ආදායම් හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් (අ) උපඡේදයේ සඳහන් විධිවිධාන අදාළ නොවේ.

2. ශ්‍රී ලංකාවේදී ද්විත්ව බදුකරණය වැළැක්වීම පහත පරිදි සිදු කළ යුතුය.

(අ) මෙම සම්මුතියෙහි විධිවිධානයන්ට යටත්ව, ශ්‍රී ලංකාවේ බල පවත්නා නීති ශ්‍රී ලංකාව තුළ ආදායම් හෝ ප්‍රාග්ධන බදුකරණය සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාත්මක වනු ඇත. ආදායම හෝ ප්‍රාග්ධනය ලක්සම්බර්ග්හි දී බද්දට යටත් වන විට පහත උපඡේදයට අනුකූලව ද්විත්ව බදුකරණය සඳහා සහනයන් ලබා දිය යුතුය.

(ආ) ශ්‍රී ලංකාවේ වාසිකයකු ලක්සම්බර්ග් රාජ්‍යය වෙතින් ආදායමක් උපයා ගනු ලැබීමේදී හෝ ලක්සම්බර්ග්හි පිහිටි ප්‍රාග්ධනයක් ඔහු සතුව පැවතීමේදී එම ආදායම හෝ ප්‍රාග්ධනය මෙම සම්මුතියේ විධිවිධානයන්ට අනුකූලව ලක්සම්බර්ග්හිදී බද්දට යටත් කළ හැකි අතර, එකී ආදායම හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ගෙවිය යුතු ලක්සම්බර්ග් බදු ප්‍රමාණය එකී ආදායම හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් එම වාසිකයා වෙත පනවන ලද ශ්‍රී ලංකා බද්ද සඳහා බදු බැරක් ලෙස ඉඩ දිය යුතු වේ. කෙසේ වුවද, එම බදු බැර, එම ආදායම හෝ ප්‍රාග්ධනය මත ආරෝපණය කළ හැකි ශ්‍රී ලංකා බදු ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක බදු බැරක් ඉඩ දීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ගෙවන ලද බද්දට එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ගෙවිය යුතු නමුත්, බදු දිරි ගැන්වීම් වශයෙන් එහි පවත්නා නෛතික විධිවිධාන යටතේ එම රාජ්‍යය විසින් අඩු කරන ලද හෝ අත් හරින ලද බද්ද ද ඇතුළත් බව සැළකිය යුතුය.

මෙම ඡේදයේ සඳහන් විධිවිධාන වසර 10 ක කාල පරිච්ඡේදයක් සඳහා අදාළ වනු ඇත. නිසි බලධාරින්ගේ අන්‍යොන්‍ය එකඟතාවය මත මෙම කාල පරිච්ඡේදය දීර්ඝ කළ හැකි වේ.

*24 වැනි වගන්තිය*

*වෙනස් ලෙස නොසැලකීම*

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක රට වැසියන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, වාසිකභාවය පිළිබඳව විශේෂිතව සමාන තත්ත්වයන් යටතේ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ රටවැසියන් කෙරෙහි බල පවත්නා යම් බදුකරණයකට හෝ සම්බන්ධිත අවශ්‍යතාවයකට වඩා වෙනස් වූ හෝ දුෂ්කර වූ බදුකරණයකට හෝ අවශ්‍යතාවයකට යටත් නොකරනු ලැබිය යුතුය. 1 වැනි වගන්තියේ විධිවිධාන නොතකා ගිවිසුම්කාර රාජ්‍යයන් එකක හෝ දෙකෙහිම වාසිකයන් නොවන තැනැත්තන්ට ද මෙම විධිවිධාන අදාළ විය යුතුය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් සතු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයක් මත, එම කටයුතුවලම නියැලෙන අනෙක් රාජ්‍යයේ ව්‍යවසායන් සම්බන්ධයෙන් වන බදුකරණයට වඩා අවාසි සහගත වන පරිදි එකී අනෙක් රාජ්‍යයේදී බදු අය නොකළ යුතුය. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් සිය වාසිකයන්ට සිවිල් තත්ත්වය හෝ පවුලේ වගකීම් හේතු කොටගෙන බදු කාර්යය සඳහා දෙනු ලබන පෞද්ගලික දීමනා, සහන සහ අඩු කිරීම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට ලබාදීමට මෙම විධානය බැඳී ඇතැයි යනුවෙන් තේරුම් නොගත යුතුය.

3. 9 වැනි වගන්තියෙහි 1 වන ඡේදය, 11 වන වගන්තියෙහි 7 වන ඡේදය හෝ 12 වන වගන්තියෙහි 6 වන ඡේදය යන ඡේදයන්හි සඳහන් විධිවිධාන බලපැවැත්වෙන අවස්ථාවන්හිදී හැර, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකුට ගෙවනු ලබන පොළී, රාජ්‍යභාග සහ අනෙකුත් වියදම් (එකී ව්‍යවසායේ බදු අයකළ හැකි ලාභ නිර්ණය කිරීමේ කාර්යයේදී) පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවූ සේ සලකා එම කොන්දේසි යටතේ ම අඩු කළ හැකි ය. එමෙන්ම ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ඇති යම් ණය මුදලක් එකී ව්‍යවසායේ බදු අය කළ හැකි ප්‍රාග්ධනය නිර්ණය කිරීමේ කාර්යය සඳහා පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේ වාසිකයෙකු සමඟ ගිවිස ගන්නා ලද්දක් සේ සළකා එම කොන්දේසි යටතේම අඩුකළ හැකි ය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායන්හි ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු හෝ වාසිකයන් වැඩි දෙනෙකු විසින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් අයත් කරගෙන සිටින කල්හි හෝ පාලනය කරනු ලබන කල්හි, එකී පළමුව සඳහන් රාජ්‍යයේ එබඳු වෙනත් ව්‍යවසායන් යටත්වන හෝ යටත් කළ හැකි වන බදුවලට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට වඩා වෙනස් වූ හෝ ඉසිලීමට වඩා දුෂ්කර වූ කිසිදු බද්දකට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට එකී පළමුව සඳහන් රාජ්‍යයෙහි දී යටත් කරනු නොලැබිය යුතු ය.

5. 2 වැනි වගන්තියෙහි කුමක් සඳහන් වුවද, මෙම වගන්තියේ විධිවිධාන සෑම වර්ගයකම සහ විස්තරයකටම අයත් බදු සම්බන්ධයෙන් අදාළ වේ.

*25 වැනි වගන්තිය*

*අන්‍යෝන්‍ය එකඟත්ව ක්‍රියාපිළිවෙල*

1. ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙන් එකක හෝ දෙකෙහිම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙම සම්මුතියෙහි විධිවිධානයන්ට අනුකූල නොවන අයුරින් තමා බදුකරණයට පාත්‍රවන්නේ යයි හෝ එසේ පාත්‍රවී ඇතැයි යම් ගිවිසුම්කාර රාජ්‍යයක තැනැත්තෙකු සලකන අවස්ථාවක, එකී රාජ්‍යයන්හි අභ්‍යන්තර නීති මගින් සලසා ඇති විධිවිධානයන් නොසලකා, ඔහු වාසිකයකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත හෝ ඔහුගේ විෂය, 24 වැනි වගන්තියේ 1 වැනි ඡේදය යටතට පත්වේ නම්, ඔහු රටවැසියෙකු වන රාජ්‍යයේ නිසි බලධරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකිය. මෙම සම්මුතියෙහි විධිවිධානවලට අනුකූල නොවන බදුකරණය ප්‍රතිඵලයක් වීමට හේතුවන ක්‍රියාව පිළිබඳ ප්‍රථම දැන්වීමෙන් වර්ෂ තුනක් ඇතුළත එකී කරුණු ඉදිරිපත් කිරීම කළ යුතු ය.

2. විරෝධතාවය යුක්ති සහගත යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම් සහ තනිව යෝග්‍ය විසඳුමක් කරා එළඹීමට ඔහු අපොහොසත් වන්නේ නම්, මෙම සම්මුතියට අනුකූල නොවන බදුකරණය වළක්වාලීමේ අදහසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා සමඟ අන්‍යෝන්‍ය එකඟත්වයෙන් තත්ත්වය නිරාකරණය කර ගැනීමට ඔහු උත්සාහ කළ යුතුය. ගිවිසුම්කාර රාජ්‍යයේ දේශීය නීතිවල කාලය පිළිබඳ පවත්නා සීමාවන් නොතකා එකඟතාවයට පැමිණ ඕනෑම කරුණක් ක්‍රියාත්මක කළ හැකි ය.

3. මෙම ගිවිසුම අර්ථ නිරූපනය කිරීම හෝ අදාළ කිරීම සම්බන්ධයෙන්, යම් දුෂ්කරතාවයක් හෝ සැකයක් පැන නගී නම් ඒවා අන්‍යෝන්‍ය එකඟත්වයෙන් නිරාකරණය කරගැනීමට ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන් උත්සාහ කළ යුතුය. මෙම ගිවිසුමෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථාවන්හිදී ද ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සඳහා ඔවුන් සාමූහිකව සාකච්ඡා කළ යුතුය.

4. පෙරාතු ඡේදවල අර්ථ සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන්ට කෙළින්ම එකිනෙකා අතර අදහස් හුවමාරු කරගත හැකිය. මෙම වගන්තියේ සඳහන් අන්‍යෝන්‍ය එකඟතා ක්‍රියා පරිපාටිය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධාරීන්ට සුදුසු ද්විපාර්ශික උපදෙස් ලබා ගැනීම් අනුගමනය කළ හැකි වේ.

*26 වැනි වගන්තිය*

*තොරතුරු හුවමාරු කර ගැනීම*

1. මෙම සම්මුතියෙහි විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන්නේ යැයි පූර්ණ නිගමනයකට එළඹිය හැකි වන්නා වූ, හෝ බදුකරණය මෙම ගිවිසුමට ප්‍රතිවිරුද්ධ නොවන තාක්දුරට ගිවිසුම්කාර රාජ්‍යයන් ඒවායේ දේශපාලන උප කොට්ඨාශ හෝ පළාත් පාලන ආයතන වෙනුවෙන් පනවන ලද ඕනෑම විස්තරයකට අයත් බදු සම්බන්ධයෙන් වන නීතීන් පරිපාලනය හෝ බලාත්මක කිරීම සඳහා තොරතුරු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරයන් විසින් හුවමාරු කර ගතයුතු ය. තොරතුරු හුවමාරු කර ගැනීම 1 වැනි හා 2 වැනි වගන්තිවලින් සීමා නොවේ.

2. 1 වැනි ඡේදය යටතේ ගිවිසුම්කාර රාජ්‍යයකට ලැබෙන යම් තොරතුරක්, එම රාජ්‍යයේ දේශීය නීති යටතේ ලබාගත් තොරතුරු රහස්‍ය සේ සලකන පරිද්දෙන්ම සැලකිය යුතු අතර, පළමුවන ඡේදයෙහි සඳහන් හෝ ඉහත සඳහන් කර නොමැති බදුවලට අදාළ තක්සේරු කිරීම හෝ අයකිරීම, එම බදු බලාත්මක කිරීම හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම හෝ උපඡේද 1 හි සඳහන් බදු සම්බන්ධ වන

අභියාචනයක් තීරණය කිරීම හා සම්බන්ධ වූ තැනැත්තන්ට හා බලධරයන්ට (උසාවි හා පරිපාලන මණ්ඩල ද ඇතුළුව) පමණක් හෙළි කළ යුතු ය. එවැනි තැනැත්තන් හෝ බලධරයන් එවැනි කටයුතු සඳහා පමණක් මෙම තොරතුරු භාවිතා කළ යුතු ය. ඔවුන්ට ප්‍රසිද්ධ උසාවි කටයුතුවල දී හෝ අධිකරණ ක්‍රියා කටයුතුවලදී එම තොරතුරු හෙළි කළ හැකි ය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධාන මගින් ගිවිසුම්කාර රාජ්‍යයක් මත පහත සඳහන් බැඳීම් පැනවෙන්නේ යයි කිසිදු අවස්ථාවක දී තේරුම් නොගත යුතු ය.

(අ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති හෝ පරිපාලනමය භාවිතයන් වලින් වෙනස් ආකාරයට පරිපාලනමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම ;

(ආ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ හෝ සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලියේදී ලබාගත නොහැකි තොරතුරු සැපයීම ;

(ඇ) යම් වෙළඳ, ව්‍යාපාරික, කාර්මික, වාණිජ හෝ වෘත්තීය රහසක් හෝ වෙළෙඳ ක්‍රියාවලියක් හෙළිදරව් විය හැකි තොරතුරක් සැපයීම හෝ රජයේ ප්‍රතිපත්තියට පටහැනි වන යම් තොරතුරක් සැපයීම.
(Ordre Public)

4. මෙම වගන්තියට අනුකූලව යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් තොරතුරු අපේක්ෂා කරන්නේ නම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් තම බදු පරමාර්ථයන් සඳහා එවැනි තොරතුරු අවශ්‍ය නොවන්නේ වුව ද, අපේක්ෂිත තොරතුරු ලබාගැනීම පිණිස එකී තොරතුරු රැස්කිරීමේ ක්‍රියා මාර්ග භාවිතා කළ යුතු ය. පූර්ව වාක්‍යයෙහි ඇතුළත් වගකීම 3 වන ඡේදයේ සඳහන් සීමාවන්ට යටත් වන නමුත් කිසිදු අවස්ථාවක දී එකී සීමාවන් මගින් ගිවිසුම්කාර රාජ්‍යයක්, හුදෙක් එවැනි තොරතුරු සම්බන්ධයෙන් දේශීය වශයෙන් උනන්දුවක් නැති නිසාම එම තොරතුරු සපයාදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ දීමක් ලෙස තේරුම් නොගත යුතුය.

5. තොරතුරු, බැංකුවක් භාරයේ පැවතීම, වෙනත් මූල්‍ය ආයතනයක් භාරයේ පැවතීම, නාමිකයෙකු වශයෙන් හෝ තැනැත්තෙකු නියෝජිත ආයතනයක් වෙනුවෙන් ක්‍රියාකිරීම හෝ පීත කොමිසම් භාරකරු වශයෙන් කටයුතු කිරීම මත තබා ගැනීම හේතුවෙන්ම හෝ එය තැනැත්තෙකු ගේ අයිතිය පිළිබඳ හිමිකම්වලට සම්බන්ධ වූවක් නිසාම හුදෙක් එම තොරතුරු සපයා දීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩදීමක් ලෙස 3 වන ඡේදයේ සඳහන් විධිවිධාන වටහා නොගත යුතු ය.

### *27 වැනි වගන්තිය*

*රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයින් සහ කොන්සල් තනතුරු*

ජාත්‍යන්තර නීතියේ පොදු නීති රීති යටතේ හෝ විශේෂ ගිවිසුම්වල විධිවිධාන යටතේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයින්ගේ හෝ කොන්සල් තනතුරුවල මූල්‍ය වරප්‍රසාද කෙරෙහි මෙම සම්මුතියේ කිසිවක් බල නොපෑ යුතු ය.

### *28 වැනි වගන්තිය*

*බලාත්මක කිරීම*

1. මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා ස්වකීය නීතිය මගින් අවශ්‍ය කෙරෙන කාර්යය පටිපාටි සම්පූර්ණ කර ඇති බව, එක් එක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයන් හරහා අනෙක් රාජ්‍යයට ලිඛිතව දන්වා සිටිය යුතු ය. අවසන් නිවේදනය ලැබෙන දිනෙන් පසුව එළඹෙන තිස් වැනි දින සිට මෙම සම්මුතිය බල පැවැත්වෙනු ඇත.

2. මෙම සම්මුතියේ විධිවිධාන :

(අ) ප්‍රභවයේදී රඳවා ගනු ලබන බදු සම්බන්ධයෙන්, සම්මුතිය බලාත්මක වන වර්ෂයට ඉක්බිතිවම එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව උද්ගතවන ආදායම වෙනුවෙන් ; සහ

(ආ) අනෙකුත් ආදායම් මත බදු සහ ප්‍රාග්ධනය මත බදු සම්බන්ධයෙන්, සම්මුතිය බලාත්මක වන වර්ෂයට ඉක්බිතිවම එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි වර්ෂයක් සඳහා අය කළ හැකි බදු සම්බන්ධයෙන්,

මෙම සම්මුතිය අදාළ විය යුතු ය.

*29 වැනි වගන්තිය*

*අවසන් කිරීම*

1. යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් අවසන් කරනු ලබන තෙක් මෙම සම්මුතිය බල පැවැත්විය යුතු වේ. සම්මුතිය බලාත්මක වන දිනයේ සිට වසර පහක කාල පරිච්ඡේදයකින් පසුව එළැඹෙන ඕනෑම ලිත් වර්ෂයක් අවසන්වීමට අවම වශයෙන් මාස 06 කට හෝ ඉන් පෙර රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා අවසන් කිරීම පිළිබඳ නිවේදනයක් කිරීම මගින් කවර හෝ ගිවිසුම්කාර රාජ්‍යයකට මෙම සම්මුතිය අවසන් කළ හැකි ය.

2. එවැනි අවස්ථාවක දී :

(අ) ප්‍රභවයේදී රඳවාගනු ලබන බදු සම්බන්ධයෙන්, මෙම සම්මුතිය අවසන් කිරීම පිළිබඳව නිවේදනය කරන ලද වර්ෂයට ඉක්බිතිවම එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමුවන දින හෝ ඉන් පසුව උද්ගතවන ආදායම සම්බන්ධයෙන් ; සහ

(ආ) අනෙකුත් ආදායම් මත බදු හා ප්‍රාග්ධනය මත බදු සම්බන්ධයෙන්, එකී නිවේදනය සිදුකරන ලද වර්ෂයට පසුව එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි වර්ෂයක් සඳහා අය කළ හැකි බදු සම්බන්ධයෙන්,

මෙම සම්මුතිය ක්‍රියාත්මක වීම අවසන් වන්නේය.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය පවරනු ලැබූ මෙහි පහත අත්සන් කරන අය මෙම සම්මුතියට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත වන පාඨයන්ගෙන් යුක්ත, සිංහල, ප්‍රංශ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පිටපත් දෙකකින් යුතුව, 2013 ජනවාරි මස 31 වන දින අත්සන් තබන ලදී. අර්ථ නිරූපණයේදී ප්‍රතිවිරුද්ධ අවස්ථා ඇතිවුවහොත් ඉංග්‍රීසි පිටපත බල පැවැත්විය යුතු ය.

පී. එම්. අම්සා
බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා තානාපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්

ලුක්ෆ්‍රිඩීන්
මුදල් අමාත්‍ය
ලක්සම්බර්ග් මහා ආදිපාදී වසමේ
ආණ්ඩුව වෙනුවෙන්

**සන්ධානය**

ආදායම මත සහ ප්‍රාග්ධනය මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ලක්සම්බර්ග් මහා ආදිපාදී වසමේ ආණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර සම්මුතිය අත්සන් කිරීමේදී පහත සඳහන් විධිවිධාන මෙම සම්මුතියෙහි සංඝටනීය කොටසක් විය යුතු බවට දෙපාර්ශවයම එකඟ වී ඇත :

(i) 4 වන වගන්තියට අදාළව

ගිවිසුම්කාර රාජ්‍යයක ස්ථාපිත සහ එම ගිවිසුම්කාර රාජ්‍යයේ බදු කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන සාමූහික ආයෝජන මාධ්‍යයක්, එය ස්ථාපනය කර ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකු ලෙසද එමගින් ලැබෙන ආදායමේ අර්ථලාභී හිමිකරු ලෙස ද සැලකේ.

(ii) 26 වන වගන්තියට අදාළව

සම්මුතිය යටතේ තොරතුරු ලබා ගැනීම සඳහා ඉල්ලීමක් සිදු කිරීමේදී අයදුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියා විසින් එකී තොරතුරු ඉල්ලා සිටිනු ලබන රාජ්‍යයේ නිසි බලධාරියා වෙත එම ඉල්ලීම සඳහා තොරතුරුවල පූර්වේක්ෂ අදාළත්වය පෙන්නුම් කිරීම පිණිස පහත තොරතුරු සැපයිය යුතුය.

(අ) පරීක්ෂණය හෝ විමර්ශනය යටතේ සිටින පුද්ගලයාගේ අනන්‍යතාවය.

(ආ) අපේක්ෂිත තොරතුරුවල ස්වභාවය සහ ඉල්ලීම යොමු කර ඇති රාජ්‍යයෙන් ඉල්ලුම්කාර රාජ්‍යය විසින් එම තොරතුරු ලබා ගැනීමට බලාපොරොත්තු වනුයේ කුමන ස්වරූපයෙන්ද යන කරුණු අඩංගු ප්‍රකාශනයක්.

(ඈ) එම තොරතුරු අපේක්ෂා කරනු ලබන බදු කාර්යය.

(ඇ) ඉල්ලා සිටින තොරතුරු, ඉල්ලීම යොමු කර ඇති රාජ්‍යය සතු බවට හෝ එකී ඉල්ලීම යොමු කර ඇති රාජ්‍යයේ අධිකරණය කලාපය තුළ වූ පුද්ගලයෙකු සතුව හෝ ඔහුගේ පාලනය යටතේ පවතින බවට විශ්වාස කළ හැකි සාධක.

(ඉ) ඉල්ලා සිටින තොරතුරු යම් පුද්ගලයෙකු සතුව ඇතැයි විශ්වාස කරන්නේ නම් දැන සිටින ප්‍රමාණයට එකී පුද්ගලයාගේ නම සහ ලිපිනය.

(ඊ) විසමානුපාතික දුෂ්කරතාවයන් ඇති කරවිය හැකි අවස්ථාවන්හිදී හැර, අයදුම්කාර රාජ්‍ය විසින් තොරතුරු ලබා ගැනීම සඳහා තම භූමි ප්‍රදේශයේ පවතින සියලුම විධි ක්‍රමයන් භාවිතා කර ඇති බවට ප්‍රකාශයක්.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය පවරනු ලැබූ මෙහි පහත අත්සන් කරන අය මෙම සන්ධානයට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත වන පාඨයන්ගෙන් යුක්ත, සිංහල, ප්‍රංශ හා ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් දෙපිටපතකින් යුතුව, 2013 ජනවාරි මස 31 වන දින අත්සන් තබන ලදී. අර්ථ නිරූපණයේදී ප්‍රතිවිරුද්ධ අවස්ථා ඇති වුවහොත් ඉංග්‍රීසි පිටපත බල පැවැත්විය යුතු ය.

පී. එම්. අම්සා
බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා තානාපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්

ලුක්ෆ්‍රිඩීන්
මුදල් අමාත්‍ය
ලක්සම්බර්ග් මහා ආදිපාදී වසමේ
ආණ්ඩුව වෙනුවෙන්

12 - 505

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.